# සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
# சமுர்த்தி அபிவிருத்தி திணைக்களம்
# Department of Samurdhi Development

මුදල් අමාත්‍යාංශය
සමෘද්ධි , ගෘහ ආර්ථික , ක්ෂුද්‍ර මූල්‍ය , ස්වයං රැකියා හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය
நிதி அமைச்சு
சமுர்த்தி, வதிவிடப் பொருளாதார,நுண்நிதிய, சுயதொழில்,மற்றும் வியாபார அபிவிருத்தி இராஜாங்க அமைச்சு
Ministry of Finance
State Ministry of Samurdhi, Household Economy, Micro Finance, Self Employment and Business Development


| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல / My No: DSD/HO/02/Ad/12/වා./ස්.මා. | ඔබේ අංකය / உமது இல / Your No: ............ | දිනය / திகதி / Date: 2021.10.26 |

සියළුම දිස්ත්‍රික් ලේකම්/දිස්ත්‍රික් සමෘද්ධි අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරුන්,
දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂවරුන්,
ප්‍රාදේශීය ලේකම්වරුන්,
නියෝජ්‍ය අධ්‍යක්ෂ /සහකාර අධ්‍යක්ෂවරුන්,
සමෘද්ධි කළමනාකරුවන්, සමෘද්ධි සංවර්ධන නිලධාරින් වෙත.

**<u>සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ සේවය කරන නිලධාරින්ගේ</u>**
**<u>වාර්ෂික ස්ථාන මාරු ක්‍රියාවලිය - 2022</u>**

උක්ත කරුණට අදාළව මා විසින් ඔබ වෙත නිකුත් කළ මාගේ සමාංක හා 2021.10.14 දිනැති වාර්ෂික ස්ථාන මාරු පටිපාටිය හා බැඳේ.

02. ඒ අනුව, සියළුම නිලධාරීන්ගේ ස්ථාන මාරු පරිපාටිවල සඳහන් වාර්ෂික ස්ථාන මාරු කාල සටහන හා පහත සඳහන් සංශෝධන කරනු ලබන බව කාරුණිකව දැනුම් දෙමි.

| වාර්ෂික ස්ථාන මාරු කාල සටහන | |
|---|---|
| ඔක්තෝබර් 15 ට පෙර | ස්ථාන මාරු පටිපාටිය / චක්‍රලේඛය ප්‍රසිද්ධ කිරීම |
| නොවැම්බර් 10 ට පෙර | ස්ථාන මාරු අයදුම්පත් දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ / ප්‍රාදේශීය ලේකම් / ප්‍රධාන කාර්යාලය වෙත ඉදිරිපත් කිරීම |
| නොවැම්බර් 25 ට පෙර | මාරු මණ්ඩල රැස්වී තීරණ ගෙන අවසන් කිරීම |
| දෙසැම්බර් 15 ට පෙර | ස්ථාන මාරු නියෝග දැන්වීම |
| ජනවාරි 01 ට පෙර | ස්ථාන මාරු පිළිබඳව දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ / ප්‍රාදේශීය ලේකම් / ප්‍රධාන කාර්යාලය වෙත අභියාචනා ඉදිරිපත් කිරීම. |
| ජනවාරි 15 ට පෙර | අභියාචනා මණ්ඩල තීරණ දැනුම් දීම හා වාර්ෂික ස්ථාන මාරු නියෝග නිකුත් කරීම |
| පෙබරවාරි 01 ට පෙර | වාර්ෂික ස්ථාන මාරු නියෝග ක්‍රියාත්මක කිරීම |

03. එසේම විධායක සේවා නිලධාරින් හා රියදුරු සේවාව සඳහා වන වාර්ෂික ස්ථාන මාරු පටිපාටිවල අනු අංක 2.1 හි සඳහන් සියළුම කරුණු;
2.2 හි II හා III හි සඳහන් කරුණු හා
2.3 හි සඳහන් **"ප්‍රාදේශීය ලේකම් කාර්යාල"** යන කරුණු ඉවත් කිරීමෙන් සංශෝධනය කරනු ලැබේ.


**1වන අදියර,4 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල. /1ம் கட்டம், 4 வது மாடி,செத்சிறிபாய பத்தரமுல்ல /1st Step, 4 th floor, Sethsiripaya Battaramulla**

| | අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் தலைமையதிபதி / Director General | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පාලන හා ආයතන) / மேலதிக பணிப்பாளர் தலைமையதிபதி ( நிர்வாகம்/தாபனம்) / Additional Director General (Admin & Establishment) | ප්‍රධාන ගණකාධිකාරී / பிரதான கணக்காளர் / Chief Accountant | අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය) / பணிப்பாளர் (குறு நிதி ) / Director ( Micro Finance) | කාර්යාලය / அலுவலகம் / Office |
|---|---|---|---|---|---|
| Tel- | 011-2872202 | 011-2873799 | 011-2869742 | 011-2889003 | 0112872202 |
| Fax - | 011-2889002 | 011-2873996 | 011-2869742 | 011-2887469 | |
| E-mail- | dg@samurdhi.gov.lk | diradmin@samurdhi.gov.lk | finance@samurdhi.gov.lk | | |
| | | **Hot Line :0112-889007** | | **Hot Line:0112-885582** | **Hot Line: 011- 2887722** |

04. 2.2 හි VIII ලෙස සමාජ සංවර්ධන නිලධාරි ස්ථාන මාරු කිරීමේ දී හැකි සෑම විටම සමාජ සංවර්ධන විෂයට බාධාවක් නොවන පරිදි ආසන්නතම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට මාරුවීම සඳහා අවස්ථාවක් සළසා දියයුතු අතර, ඒ සඳහා නිලධාරියා අකමැති අවස්ථාවක සාමාන්‍ය ස්ථාන මාරු ක්‍රියාවලියට යටත්ව කටයුතු කළ හැකිය යන්න ඇතුළත් විය යුතුය.

05. අභ්‍යන්තර නිලධාරි සඳහා වන ස්ථාන මාරු පටිපාටියෙහි අංක 5 හි දැක්වෙන දිස්ත්‍රික් ස්ථාන මාරු මණ්ඩල සංයුතියෙහි **"දිස්ත්‍රික් විගණන කළමනාකරු"** වෙනුවට **"දිස්ත්‍රික් විගණන කණ්ඩායම් නායක"** යනුවෙන් සංශෝධනය විය යුතුය.

06. මෙම අවස්ථාවේදී නිලධාරින්ගේ උසස්වීම් විශ්‍රාම ගැන්වීම් කඩිනම් කිරීමේ වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක වන බැවින් ඒ සඳහා පුහුණුවලත් නිලධාරින් 2022 වසර සඳහා වන ස්ථාන මාරුවීම සඳහා **පමණක්** ස්ථාන මාරු කළ යුතුවන්නේ එම විෂයන් සඳහා පුහුණුවලත් අනුප්‍රාප්තිකයන් යෙදවිය හැකිනම් පමණි.

07. මෙම වාර්ෂික ස්ථාන මාරුවීම් සඳහා කාලය ගණනය කරනු ලබන්නේ 2021 දෙසැම්බර් 31 වන දිනටය.

08. සියළුම දුෂ්කර සේවා ස්ථාන තීරණය කළ යුතු වන්නේ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ විධිවිධාන පරිදිය.

ආර්.පී.බී. තිලකසිරි
අධ්‍යක්ෂ ජනරාල්

පිටපත්:-

1. ලේකම්, සමෘද්ධි ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය - කා.දැ.ගැ.ස.
2. අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය) රා.ආ. - දැ.ගැ.ස.
3. ප්‍රධාන ගණකාධිකාරී - දැ.ගැ.ස.
4. ප්‍රධාන අභ්‍යන්තර විගණක - දැ.ගැ.ස.